**සසර වසන තුරු**
**නිවන් දකින තුරු**
**පින් කෙත හෙළ රන් දෙරණේ**
**යළි උපදින්නට**
**හේතු වාසනා වේවා෴**

ඩෝල්ටන් අල්විසුන්ගේ මේ පද පෙළ ගීයක් ලෙසින් අපට ඇසෙන්නේ මධුරතර වූත් ගැඹුරු වූත්, භාවමය හඬකින් ඒ හෙළ ගී කෙතේ මියැසි සංතිවරයාණන් වන පණ්ඩිත් අමරදේවයන්ගේ හඬයි. මියැසි ස්වර නැණින් ගායනයෙන්, වාදනයෙන් මතු නොව නිර්මාණකරණයෙන්ද මුදුන් මල්කඩක් වූ එතුමන් සැබෑ දිවියේදී සොඳුරුතර වූ මිනිසෙකි. අව්‍යාජ කලාකරුවෙකි. පණ්ඩිත් අමරදේවයන් මේ වන විට නිකුත් කළ නවතම ගී එකතුවේ නම ද ''සොඳුරු වූ මිනිසා'' යි.



# සොඳුරු වූ මිනිසා

සොඳුරු වූ මිනිසා
අහස දිය ගොඩ සරන සත ලෙස
විසම වේද කෙලෙසා
සොඳුරු වූ මිනිසා?

වග වලස් සිහ උරඟ මිග රැළ
රඳන වන පෙත නිලන තුරු ලිය
නෙක් රුවින් - නෙක් වනින්
බෙදී ගිය විලසා
බෙදෙනු කිම එක ඉර හඳක් යට
උපත ලද මිනිසා?

අඹර පියඹා යන සියොත් පෙළ
දියඹ පිහිනා යනෙන මින් රළ
නෙක් රුවින් - නෙක් වනින්
බෙදී ගිය විලසා
බෙදෙනු කිම එක මිහි මවගේ කුස
උපත ලද මිනිසා?
සොඳුරු වූ මිනිසා.......

පද : මහින්ද දිසානායක :ශ්‍රී ලංකාව*
තනුව : පණ්ඩිත් අමරදේව
සංගීතය : නාලක අංජනකුමාර

''සිනිදු සුදු මුතු තලාවේ.....''

''සත් සමුදුරු'' සිනමා පටය වෙනුවෙන් මහගම සේකරයන්ගේ පද පෙළ සෝමදාස ඇල්විටිගල සංගීතවේදියාණන්ගේ මියැසියට අනුව පණ්ඩිත් අමරදේවයන් ගයමින් හෙළ ගී පොතේ නොමැකෙන සටහන් තැබුවේ එහි වන සංකීර්ණ මියැසි රටාපත් නිසාමයි. වසර අටත් වියැති දරුවකු ඒ ගීයේ ස්වර රටා වාද්‍ය භාණ්ඩයකින් තොරව මනෝමයෙන් සටහන් තැබීමට හපන් වී යැයි කිවහොත් ඇදහිය හැකිවේද? ඒ ද එය සත්‍යයකි. ඒ දරුවා අද යෞවනයෙකි. පණ්ඩිත් අමරදේවයන්ගේ සෙවනේම හිඳිමින් එතුමන්ගේ නව නිර්මාණවලට දායකවෙමින් එතුමන් වෙනුවෙන් නව නිර්මාණ කරමින් අදටත් හපන්කම් පානා තවත් එක් සොඳුරු වූ මිනිසෙකි. ඔහු අද ''සොඳුරු වූ මිනිසා'' සංගත තැටියට වැඩිම මියැසිමය දායකත්වයක් ලබා දුන් නාලක අජේනකුමාර තරුණ සංගීතවේදියාය ඒ.






සිසිර දිසානායක

පණ්ඩිත් අමරදේවයන්ගේ ''සොඳුරු වූ මිනිසා'' ගී එකතුව පිළිබඳවත් එහි තමන්ගේ දායකත්වයත් පිළිබඳවත් එහි තමන්ගේ දායකත්වයත් පිළිසඳරක යෙදීමට මෙවර ගී සඳළුවට ඇරයුම් ලබන්නේ නාලක අංජනකුමාර තරුණ සංගීතවේදියායි. අති දක්ෂ ගිටාර් වාදන ශිල්පියෙකු වන ඔහු ඉදිරිපත් ''සුරම්‍ය රාත්‍රිය'' රූපවාහිනී වැඩ සටහන ගිටාර් වලින්ම සංගීතය සපයන සංගීතමය වැඩසටහනකි.
'' නාලකට ඇහෙනවා වැඩියි, ඒ නිසා ලේසි නෑ නාලක එක්ක වැඩක් කරන්න. හරියට ම ඕන'' නාලකට මේ සහතිකය ලබා දුන්නේ මෙහි අප හා වෙසෙන ප්‍රවීණ වයලින් වාද්‍ය ශිල්පී ඩී.ඩී. ගුණසේනයන්ය. ඉන් නාලකගේ ස්වර ඥාණයන්, ඒ සඳහා වන සංවේදී බවත් මෙන්ම ගී හඩ කැවීම්වලදී සහ මුසු කිරීම් වලදී තාක්ෂණයෙන් දක්වන ශිල්පීය නිපුණත්වයත් පිළිබඳව කියවෙයි.
''මම පොඩි කාලේ ඉදලම අමරදේවයන්ගේ ගීතවලට ඇළුම් කළා. '' නාලක අප හා දුරකථනයෙන් සම්බන්ධ වෙයි.

''ඉතිං ඒ නිසාම ඒ ගීත ගයන්නට, වයන්නටත් උත්සාහ තළේ පාසල් කාලයේ ඉදන්මයි. ඉතිං නිවී සැනසිල්ලේ උපරිම තලයකට එන්න ලැබුණෙ අවස්ථාව තමයි අමරදේවතුමා එක්ක කටයුතු කරන්න ලැබුණ එක.''

'' 1990 වර්ෂයේ ඉදන් ලෝකයේ වෙනත් රටවල්වල පැවැත්වුණු එතුමාගේ ප්‍රසංගවලට එතුමා මාව සහභාගී කර ගත්තා. සමහර විට අපි යන්නේ වාදකයින් හතර දෙනෙක් පස් දෙනෙක් විතරයි. විශාරද විජේරත්න රණතුංග තබ්ලාවට, ඩී. ඩී. ගුණසේන මහත්මයා වයලීනයට, මර්වින් ප්‍රියන්තයි, මමයි ගිටාරයට, ජගත් වික්‍රමසිංහ එකට දායක කරගන්න එතුමා අමතක කලේ නෑ.

''ඉතිං බොයහෝ විට ගිටාරය වාදනය කරන ගමන් ඒ ප්‍රසංගවල සංගීතය මෙහෙයවන්න සංගීත සංයෝජනය කරන්නත් වුණේ මට. අමරදේවතුමාට අසනීප තත්ත්වයක් තියෙන වෙලාවට මට ආරාධනා කරනවා පසුබිමින් ගායනා කරන්නත්. මායි එතුමයි ගත්තම අන්ත දෙකක්. ඉතිං මට ඒ ලැබෙන්නේ කියන්න බැරි තරම් වටිනා අවස්ථාවක්.''

''ඔය නිසා අමරදේවතුමාගේ විතරක් නෙවෙයි විමලා අමරදේව මහත්මියගේ, රංජන අමරදේව පුතනුවන්ගේ පවා ලොකු විශ්වාසයක් මා ගැන ගොඩනැගුණා. ඒ නිසා ඒ අයගේ මූලිකත්වයෙන් කරන සෑම දේකටම මාව සම්බන්ධ කර ගත්තා. ඒ වුණාත් ඒ වාගේ අනික් අය කරපු දේවල්වලට නම් මට අවස්ථාව ලැබුණේ නෑ. ''

''සොඳුරු වූ මිනිසා '' ගී එකතුව මෑත කාලීනව අමරදේවයන් කළ ලොකු වැඩක්. ඉතිං මාව ඒකට දායක කරගත්තෙත් අර කියපු 1990 ඉඳන් ගොඩනැගුණු විශ්වාසනීයත්වය නිසයි.

''සොදුරු වූ මිනිසා'' සංගත තැටිය දොරට වැඩියේ 2014 දී මේ ගී එකතුවේ ගීත දොළහෙන් හතකටම තනු නිර්මාණ අමරදේවතුමාගේමයි. ඒ ඇරෙන්න ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ තනු නිර්මාණ දෙකකුයි, ලයනල් අල්ගම මහත්තයාගේ තනුවකුයි, නවක ශිල්පියෙතු වන අරුණ ගුණවර්ධනයන්ගේ තනුවකුයි, නමගේ එක තනුවකුයි ගී එකතුවට ඇතුලත්. මගේ තනුවට වගේම අනික් ගීත අටකට සංගීතය නිර්මාණයෙන් ඒ වගෙම නව සංගීත සංයෝජනයෙන් දායක වෙන්න මට වාසනාව ලැබුණා. ''
අධි නීතිඥ ඩබ්. අබේසිංහයන් ලියූ ''සමාධි මහිමේ'' ජයසේන කෝට්ටේගොඩ ලියූ ''පාළුව තනිකම'', ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් ලියූ '' පාතුර හෝසි'' අනුරාධපුර වෙසෙන මහින්ද දිසානායකයන් ලියූ ''සොඳුරු වූ මිනිසා'' යන නව නිර්මාණයන්ට මෙන්ම රත්න ශ්‍රී විජේසිංහයන් ලියූ '' සුවඳ මුව රඳ'' සුනිල් සරත් පෙරේරා නිබන්ධකයාණන් ලියූ '' මනකල් හඳවිල්'' මහගම සේකරයන් ලියූ ''ඉරට මුවාවෙන්'' වැනි අප අසා ඇති ගී පණ්ඩිත් අමරදේවයන්ගේ තනු නිර්මාණ වෙයි. මෙම නව නිර්මාණ සඳහා සංගීතය නිර්මාණය කරමින්ද පැරණි ගී සඳහා නව සංගීත සංයෝජනය කරමින්ද නාලක අංජන කුමාර විශාල දායකත්වයක් දී ඇත්තේය. එමෙන්ම ලයනල් අල්ගමයන්ගේ තනු නිර්මාණයට අනුව අමරදේවයන් ගැයූ මහගම සේකරයන්ගේ නිබන්ධයක් වන ''සඳකන් පිනිදිය'' සහ ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ තනු නිර්මාණයක් අනුව ගැයූ මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ ''තාත්තා වුණාත්'' ගී සඳහා ද නව සංගීත සංයෝජනය නාලකගෙනි. කුමාර ලියනගේ නිබන්ධකයා ලියූ''එළලියේ'' ගීතයටයි. නාලක තනුව හා සංගීතය යන දෙයාකාරයෙන්ම නිර්මාණ දායකත්වය දුන්නේ. විශාරද ගුණදාස කපුගේ, විශාරද අමරසිරි පීරිස් , කරුණාරත්න දිවුල්ගනේ, විශාරද දීපිකා ප්‍රියදර්ශනී, සුනිල් එදිරිසිංහ, නිරෝෂා විරාජිනී, කසුන් කල්හාර, අමල් පෙරේරා, සශිකා නිසංසලා, නෙළු අධිකාරි, ටී.එම්.ජයර්තන, දයාන් විතාරණ වැනි ප්‍රවීණයින් රැසකට මධුර තනු නිර්මාණය කරමින් නාලක ආ ගමනේ උච්ඡස්ථානයක් නොවේද මේ?

ජානක සිරිවර්ධන ලියා අරුණ ගුණවර්ධන තනුව හා සංගීතය නිර්මාණය කල ''ගිමන් හරින දියඹ දිගේ'' ගීය මේ වන විටත් රසික හදවත් තදින්ම ඇඳබැඳගත් ගීයකි. සිඩ්නි නුවර වසන මහාචාර්ය මෛත්‍රී පනාගොඩ අධිනීතිඥවරයා ලියූ '' සෙවනැලිමිය යන සැන්දෑවේ'' ගීය අමරදේවයන්ගේ තනු නිර්මාණයක් වන අතර ආචාර්ය රෝහණ ඝවීරසිංහයන්ගේ සංගීත රටාවන් ගෙන් හැඩ වූවකි. අපි යළිත් නාලක අංජනකුමාර සංගීතවේදියාණන්ට සවන් දෙමු.

''ඇත්තටම කියනවා නම් අමරදේවතුමාගේ නවතම සංගීත තැටියේ වැඩ කටයුතුත් මේ වන කොට අවසන් කරලයි තියෙන්නේ. තවම නමක් නම් තීරණය කරලා නෑ. ඒ ගී එකතුවේ ගීත දොළහෙන් අටකට විතර මමයි සංගීත සංයෝජනය කළේ.''

''අමරදේවතුමාගේ ඔස්ට්‍රේලියානු සංචාරයන්ටත් සහභාගී වෙන්න කියලා එතුමා මට මතක් කළා. ''සසර වසන තුරු''කියන ඒ ප්‍රසංගයේ සංගීතය මෙහෙයවන්නේ ඉන්ද්‍රජිත් මිරිහාන බවයි දැනගන්න ලැබුණේ. ඉතිං ඒ ගමනේදී අමරදේවතුමාගේ අළුත්ම ගීත එකතුවක් ලබාගන්න ඔස්ට්‍රේලියාවේ ඉන්න රසිකයන්ට පුළුවන් වේවි. ''

**Tutoring**

**22 years of experience in tutoring in Melbourne with Proven Results.......!**

***Coaching for***
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

**Small groups - up to 4 students.....!**
**Individual classes on request**

**Neranjana Kudaligama**
**0408 356 821**
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

**Hemantha Devendra**
**0409 854 597**
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)